**එක්සත් ජනපද ඇමෙරිකා තානාපති කාර්යාලය - කොළඹ**
**මාධ්‍ය නිවේදනය**
Public Affairs Section
Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070
Email: VanHornNT@state.gov ● http://lk.usembassy.gov

Release No. 20170901

**දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ වැඩබලන සහකාර ලේකම් ඇලිස් ජී වෙල්ස්ගේ ශ්‍රී ලංකා සංචාරය**

**සැප්තැම්බර් 1 වැනි දා කොළඹදීය**- දකුණු සහ මධ්‍යම ආසියානු කටයුතු පිළිබඳ වැඩබලන සහකාර ලේකම් ඇලිස් ජී වෙල්ස් ඇයගේ ශ්‍රී ලංකාවේ සංචාරය සැප්තැම්බර් 2 වැනි දා නිමා කරන ඇත. සංහිඳියා ක්‍රියාවලියටත්, ආර්ථික සංවර්ධනයටත් සියලු ශ්‍රී ලාංකිකයන්ට සමාන අයිතිවාසිකම් ලබාදීමේත් ශ්‍රී ලංකා ලංකා රජයේ ප්‍රයත්නයන්ට එක්සත් ජනපදය සහයෝගය ලබා දෙන බව ඇය පැවැත්වූ සාකච්චා වලදී අවධාරණය කළාය.

තානාපති වෙල්ස් අගෝස්තු 30 ශ්‍රී ලංකාවට පැමිණියාය. මෙහිදී ඇය ශ්‍රී ලංකාවේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන සහ අගමැති රනිල් වික්‍රමසිංහ ඇතුලුව ශ්‍රී ලංකා රජයේ නියෝජිතයින් හා ද්‍රවිඩ ජාතික සන්ධානය මෙන්ම සිවිල් සමාජය ද මුණ ගැසී ශ්‍රී ලංකාවේ සංහිඳියා ක්‍රියාවලියටත් මෙම කළාපයේ ආර්ථික සංවර්ධනයටත් එක්සත් ජනපදයේ කැපවීම අවධාරණය කළාය. තානාපති වෙල්ස් ඇයගේ සංචාරය අතරතුරදී ඉන්දීය සාගර කළාප සම්මන්ත්‍රණයේ විශේෂ සැසියක් ඇමතුවාය.

එහිදී තානාපති වෙල්ස් පවසා සිටියේ ආර්ථික වර්ධනය වැඩි දියුණු කරන්නාවූ විනිවිදභාවයෙන් යුත් සංවර්ධනයක් සහ කළාපීය ඒකාබද්ධතාවය ඇතිකිරීමට ඉන්දීය සාගරය සම්බන්ධයෙන් අප සැම පොදු දැක්මක් ඇතිකරගත යුතු බවය. වගවීම, විවෘත වෙළඳ පොළවල් සහ ජනතාවට දෘශ්‍යමාන ප්‍රතිලාභ ගෙන දෙන්නාවූ ක්‍රියාකාරකම් වඩාත් ස්ථිරසාර ඒවා වනු ඇතැයි පැවසූ තානාපති වෙල්ස් නාවික ගමනාගමනයේ නිදහස සහ අර්බුදයන් සාමකාමී ආකාරයන් විසඳීම අන්තර්ගත කරගත් කළාපීය ව්‍යුහයක් ගොඩනැංවීමේ වැදගත්කම දැඩිව අවධාරණය කළාය. අන්තර් ජාතික නීතියට යටත්ව නිදහසේ යාත්‍රා කිරීමට, ගුවන් ගමන් කිරීමට සහ ක්‍රියාත්මක වීමට සියලු රටවලට අයිතියක් ඇති බවද ඇය පැවසුවාය.

තානාපති වෙල්ස් දනට ඇෆ්ගනිස්ථානය සහ පාකිස්ථානය සඳහා වූ වැඩබලන විශේෂ නියෝජිත ලෙසද කටයුතු කරනු ලබයි. මීට පෙර ඇය ජෝර්දාන හෂමිට් රාජධානියේ එක්සත් ජනපද තානාපතිනිය ලෙස සහ ජනාධිපති නිල නිවස වන වයිට් හවුස් හි රුසියාව සහ මධ්‍යම ආසියාව සම්බන්ධ කටයුතු පිළිබඳ ජනාධිපති සහායක ලෙස සහ රාජ්‍ය ලේකම් ගේ විධායක සහායිකා තනතුරේද කටයුතු කළාය. ඇය පිළිබඳ වැඩිපුර තොරතුරු සඳහා පහත දැක්වෙන වෙබ් අඩවියට පිවිසෙන්න.
https://www.state.gov/r/pa/ei/biog/230750.htm